# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2083/25 - 2018 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

9(2)(ආආ)(i) වගන්තිය යටතේ නිවේදනය

අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන පිළිබඳ අමාත්‍ය එස්. බී. නාවින්න වන මම 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(2)(ආආ)(i) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව එකී 9 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම හා පළමු වරට ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත්‍රයකට අදාළව 2018.09.01 දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් සියයක ගාස්තුවක් ගෙවිය යුතු බව මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරමි.

මෙම කාරණයට අදාළව 2015 ජූලි මස 08 වන දින අංක 1922/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 07 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

08 - 821/1

---

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

16(2)(ආ)(i) වගන්තිය යටතේ නිවේදනය

1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 16(2)(ආ)(i) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන පිළිබඳ අමාත්‍ය එස්. බී. නාවින්න වන මම 2018.09.01 දින සිට බලපැවැත්වෙන පරිදි එකී 16 වන වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක අනු පිටපතක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් පන්සියයක් විය යුතු යයි මේ නිවේදනයෙන් නියම කරමි.

මෙම කාරණයට අදාළව 2015 ජූලි මස 08 වන දින අංක 1922/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 07 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

08 - 821/2

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

දැන්වීමයි

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17(2) වගන්තිය යටතේ හැඳුනුම්පත් වල සංශෝධිත අනුපිටපත් නිකුත් කරනු ලැබීමේ දී හා 17(4) වගන්තිය යටතේ වලංගු කාලය ඉකුත් වූ, ජාතික හැඳුනුම්පතක් වෙනුවට නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබීමේ දී අය කරන ගාස්තු සංශෝධනය කිරීම**

2018.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පහත උප ලේඛනයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලබන ගාස්තු ඒ ඒ කාර්යයට ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

මෙම කාරණයට අදාළව 2015 ජූලි මස 08 වන දින අංක 1922/25 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

එස්. බී. නාවින්න,
අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 07 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

| *කාර්යය* | *ගාස්තුව* |
|---|---|
| 1. 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17(2) වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක සංශෝධිත අනු පිටපතක් නිකුත් කිරීම. | රු. 250/- |
| 2. 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 17(4) වගන්තිය යටතේ වලංගු කාලය ඉකුත් වූ, ජාතික හැඳුනුම්පතක් වෙනුවට නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම. | රු. 100/- |

08 - 821/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.